# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,495 - 2026 ජුනි මස 26 වැනි සිකුරාදා - 2026.06.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | 214 |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 216 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | |

*සැ. යු.* - අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත 2026 ජුනි මස 19 දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2026 ජුනි මස 19 දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූලි මස 17 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූලි මස 03 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 ජනවාරි මස 02 දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

213 - B 082804 - (2026/06)
E - 01

# අවසාන නියෝග

### ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත

නිරවුල් කිරීමේ ආඥාව අංක 64 (මන්නාරම)

උතුරු පළාතේ , මන්නාරම දිස්ත්‍රික්කයේ , මඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (එවකට මාන්තෙයි බස්නාහිර ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාසයේ), ප්‍රදේශයක පිහිටියා වූ ද, අංක 50 (උතුර) දරන ලංකා මැනීමේ හු ලක්ෂණාත්මක මූලික සැලැස්මේ අංක 1 (ප්‍රධාන ප්‍රදේශය) යන බිම් කට්ටිය වශයෙන් විස්තර කොට දැක්වෙන ඉඩම් සම්බන්ධයෙන් ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනතේ 4 වැනි වගන්තිය යටතේ නිරවුල් කිරීමේ දැන්වීමක් 1982 මාර්තු මස 19 වැනි දින අංක 185 දරන රජයේ *ගැසට්* පත්‍රයේ (අංක 5079 (මන්නාරම) දරන නිරවුල් කිරීමේ දැන්වීම බලනු.) සහ ඉහත කී වගන්තියෙන් නියමිත අන්අයුරින් ද නිසි පරිදි ප්‍රසිද්ධ කරනු ලැබූ හෙයින් ද :

එසේම එකී දැන්වීම අනුව භාරගනු ලැබූ සියලු අයිතිවාසිකම් පිළිබඳව එකී ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කර තිබෙන හෙයින් ද :

මෙහි පහත අත්සන් කරන මම, එකී ආඥා පනතේ 5(5) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ඉඩම් හෝ ඒවායේ කොටස් මේ ආඥාවේ උපලේඛනයෙහි නිශ්චිත වශයෙන් සඳහන් කර ඇති පරිදි නිරවුල් කරනු ලබන බවට ආඥාවක් මෙයින් නිකුත් කර සිටිමි.

එල්. ජී. පී. ප්‍රසාද්,
නිරවුල් කිරීමේ සහකාර නිලධාරි ,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ නියෝජ්‍ය කොමසාරිස් (ඉඩම්).

2026 පෙබරවාරි මස 25 වැනි දින,
බත්තරමුල්ල ,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ දී නිකුත් කරන ලදී.

### උපලේඛනය

| බිම් කට්ටි අංකය | අනු බිම් කට්ටි අංකය | ප්‍රමාණය අ. | රූ. | ප. | පිඹුරු පත්‍රයේ අංකය | නිරවුල් කළේ කවර උප වගන්තිය යටතේ ද යන වග | නිරවුල් කොට දෙන ලද්දේ කවුරුන්ට ද යන වග | වෙනත් කරුණු (කොටස් සම්බන්ධකම්, බැඳීම්, අධිකරණයට ඉදිරිපත් කර ඇති නඩුවල අංක, යනාදිය) | ඉඩම් ලියාපදිංචි කරන ලද ලියාපදිංචි කිරීමේ කාර්යාලය | වෙළුම් අංකය | පත් ඉරු අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 124 | 00 | 1 | 31.00 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 126 | 01 | 3 | 18.00 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 127 | 00 | 0 | 17.00 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 129 | 06 | 0 | 37.00 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 131 | 44 | 1 | 02.20 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 132 | 00 | 0 | 21.20 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 133 | 00 | 1 | 35.60 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 134 | 00 | 1 | 30.30 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 135 | 01 | 3 | 00.60 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |

උපලේඛනය (සම්බන්ධිතයි)

| බිම් කට්ටි අංකය | අනු බිම් කට්ටි අංකය | ප්‍රමාණය | | | පිඹුරු පත්‍රයේ අංකය | නිරවුල් කළෝ කවර උප වගන්තිය යටතේ ද යන වග | නිරවුල් කොට දෙන ලද්දේ කවුරුන්ට ද යන වග | වෙනත් කරුණු (කොටස් සම්බන්ධකම්, බැඳීම්, අධිකරණයට ඉදිරිපත් කර ඇති නඩුවල අංක, යනාදිය) | ඉඩම් ලියාපදිංචි කරන ලද ලියාපදිංචි කිරීමේ කාර්යාලය | වෙළුම් අංකය | පත් ඉරු අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අ. | රූ. | ප. | | | | | | | |
| 1 | 136 | 02 | 1 | 25.50 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 137 | 00 | 1 | 24.00 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 138 | 00 | 0 | 29.40 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 139 | 02 | 3 | 35.60 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 140 | 00 | 0 | 09.10 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 141 | 03 | 1 | 08.20 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 142 | 00 | 0 | 18.30 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 143 | 01 | 3 | 24.60 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 144 | 01 | 0 | 34.10 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 145 | 43 | 0 | 06.40 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 146 | 03 | 0 | 20.90 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 147 | 01 | 0 | 08.90 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 148 | 00 | 2 | 27.00 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 149 | 04 | 3 | 31.30 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 150 | 08 | 2 | 20.70 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 151 | 00 | 3 | 01.80 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 153 | 01 | 1 | 24.60 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 154 | 22 | 2 | 07.50 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 155 | 01 | 0 | 16.40 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |
| 1 | 156 | 5002 | 1 | 14.30 | - | 5(1) | රජය සතුයි | - | - | - | - |

**ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත සහතිකය**

ප්‍රමාණයෙන් අක්කර දහයකට අධික ඉඩමකට හෝ ඉඩම්වල එකතුවකට අදාළවන පමණට ඉහත සඳහන් නිරවුල් කිරීමේ ආඥාවේ අන්තර්ගත නිරවුල් කිරීම් සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අනුමැතිය ප්‍රකාශකර ඇති බව මෙයින් සහතික කරනු ලැබේ.

ඩී. පී. වික්‍රමසිංහ ,
ලේකම්,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය.

2026 මැයි මස 18 වැනි දින,
බත්තරමුල්ල දී ය.

06-306

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (04) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ පී. ඩී. එස්. කේ. ගුණපාල වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1984.08.28 දින ප්‍රදානය කර ඇති අංක කුරු/ප්‍ර 09973 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන කැන්දහේන, බුජ්ජොමුව පදිංචි විතානගේ කරොලිස් සිංඤෝ වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක F76/2502/86 යටතේ 1986.07.25 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැතිවීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.07.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දඹදෙණි උඩුකහ දකුණු කෝරළේ අංක 1019 - කැන්දහේන (අංක 277 - වැවල) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කැන්දහේන ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 2 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි විසින් සම්පාදිත අංක අ. ග. පි. 475 දරන රේඛා සටහනේ අංක 94 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/ අක්කර - රූඩ් 03 පර්. 37ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ වාගොල්ලේ මූකලාන රජයේ ඉඩම .

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 93 |
| *නැගෙනහිරට* | : අ. ග. පි. 474 පහළ බුජ්ජොමුව ගම් මායිම |
| *දකුණට* | : කැබලි අංක 116 |
| *බස්නාහිරට* | : ප්‍රවේශ මාර්ගය |

පී. ඩී. එස්. කේ. ගුණපාල,
ප්‍රාදේශීය ලේකම්,
අලව්ව.

2026 පෙබරවාරි මස 19 වැනි දින.

06-355

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (04) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ ඩබ්ලිව්. ආර්. ඒ. සාගරිකා සී. හේරත් වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් එක්දහස් නවසිය අසූ හතරක් වූ පෙබරවාරි මස විසි එක් වන (1984.02.21) දින ප්‍රදානය කර ඇති අංක කුරු/ ප්‍ර 06684 දරන ප්‍රධාන පත්‍රයේ හිමිකරුවන මැල්සිරිපුර, නාබැට යන ලිපිනයෙහි පදිංචි පටිකාර ආරච්චිගේ නන්තිස්හාමි වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක B/19/452/86 යටතේ 1986.03.06 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැතිවීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.07.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිරියාල හත්පත්තුවේ ඉහළ ඕතොට කෝරළේ 101 - දියතුරේ (නව 413 - නාබැට) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නාබැට නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 2 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි 2803 දරන රේඛා සටහනේ අංක 257 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූද, ප්‍රමාණයෙන් රූඩ් තුනයි (03) පර්චස් විසි හතරක් (24) විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 256 |
| *නැගෙනහිරට* | : කැබලි අංක 258 |
| *දකුණට* | : කැබලි අංක 268 ප්‍රවේශ මාර්ගය |
| *බස්නාහිරට* | : කැබලි අංක 255 ප්‍රවේශ මාර්ගය |

ඩබ්ලිව්. ආර්. ඒ. සාගරිකා සී. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
ඉබ්බාගමුව.

2025 අප්‍රේල් මස 30 වැනි දින.

06-356

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.